ජාතික ගමනාගමන කොමිෂන් සභාව
தேசிய போக்குவரத்து ஆணைக்குழு
NATIONAL TRANSPORT COMMISSION

241, උද්‍යාන පාර, කොළඹ 5.
241, பாக், வீதி, கொழும்பு 5.
241, Park Road, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No. NTC/QA/142-1/2024

ඔබේ අංකය / உமது இல. / Your No. ....................

දිනය / திகதி / Date. 2024.07.15

..........................................

විදුහල්පතිතුමනි/තුමියනි,

<u>මාර්ග ආරක්ෂාව තේමාව යටතේ වූ චිත්‍ර තරඟය.</u>

"රිය අනතුරු නොමැති හෙටක් උදෙසා පාසලින් පෙළගැසෙමු" යන තේමාව පදනම් කරගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් වාර්ෂිකව පවත්වනු ලබන චිත්‍ර තරඟය මෙවර බස්නාහිර පළාත් බල ප්‍රදේශයට අයත් සියලුම පාසල්වල (ජාතික පාසල්, පළාත් පාසල්, ජාත්‍යන්තර පාසල්) ළමුන් සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාලව මාර්ග ආරක්ෂාව යන තේමාව පදනම් කරගත් මාතෘකා ඔස්සේ පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර, (ඇමුණුම 1 සහ 2) මෙම තරඟය 01 ශ්‍රේණියේ සිට 13 දක්වා ශ්‍රේණිය දක්වා ශ්‍රේණි මට්ටමින් කාණ්ඩ **05** ක් යටතේ දිස්ත්‍රික්ක තුනෙහි (කොළඹ, ගම්පහ, කළුතර) වෙන වෙනම පවත්වනු ලැබේ. පළමුවන වටයෙන් කුසලතා සහතික පිරිනැමිය හැකි චිත්‍ර එක් දිස්ත්‍රික්කයකින් 800 ක් තෝරා ගන්නා අතර, ඊට අමතරව එක් ශ්‍රේණියකින් චිත්‍ර 18 ක් වශයෙන් උපරිම 200 ක් අවසාන වටය සඳහා තෝරාගනු ලැබේ. අවසාන වටයෙහි චිත්‍ර දිස්ත්‍රික්ක මට්ටමින් සජීවීව ඇඳීම කළ යුතු අතර, 2024 නොවැම්බර් සහ දෙසැම්බර් මස දින තුනක තෝරාගත් තරඟකරුවන් සඳහා තරඟය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. අවසන් තරඟයෙන් ශ්‍රේණි මට්ටමින් ජයග්‍රහනය කරනු ලබන සිසු දරු දැරියන් 1, 2 සහ 3 වශයෙන් 39 දෙනෙකු සඳහා එක් දිස්ත්‍රික්කයකින් 39 බැගින් දිස්ත්‍රික්ක 3 හි ම දරුදැරියන් 117 ක් සඳහා වටිනා සහතිකයක් සහ පාපැදියක් පිරිනමනු ලබන අතර, අනෙක් දරුදැරියන් සඳහා සහතිකයක් සහ සැනසිලි ත්‍යාග ලබාදීමට අපේක්ෂා කෙරේ. අවසන් මහා තරඟයට සහභාගි වන සියලුම දරුවන්ට සහතිකයක් සහ ත්‍යාගයක් ලබාදීමට කටයුතු සුදානම් කරනු ලැබේ.

**ඒ ඒ ශ්‍රේණි සඳහා මේ සමඟ අමුණා ඇති ලේඛණයේ සඳහන් කර ඇති මාතෘකා යටතේ, චිත්‍රය ඇඳිය යුතු අතර, පහත දක්වා ඇති කොන්දේසි අනුගමනය කළ යුතුය.**

දුරකථන / தொலைபேசி / Telephone

සභාපති / தலைவர் / Chairman : 2503680
කාර්යාලය / காரியாலயம் / Office : 2587372 (Hunting)
ෆැක්ස් / பக்ஸ் / Fax : 2503725, 2058138
ඊ මේල් / ஈ-மெயில் / E-mail : chairman@ntc.gov.lk

තොරතුරු හා පැමිණිලි / தகவலகளும் முறைப்பாடுகளும் / Information & Complaints : 1955, 2595555 (Hot Line)
ඊ මේල් / ஈ-மெயில் / E-mail : info@ntc.gov.lk
වෙබ් අඩවිය / வெப்சைட் / Website : www.ntc.gov.lk

- ➢ අඟල් 18 x 14 සුදු කඩදාසියෙහි චිත්‍රය ඇඳිය යුතුය.
- ➢ පාට පැන්සල්, ප්ලැටිග්නම් හැර වෙනත් ඕනෑම වර්ණ මාධ්‍යයකින් වර්ණ ගැන්විය හැක. (පැස්ටල්, වෝටර් කලර්ස් ආදිය)
- ➢ එසේම කඩදාසිය පුරාවටම චිත්‍ර ඇඳ වර්ණ ගැන්වීම අනිවාර්ය වේ.
- ➢ පෝස්ටර් මාදිලියේ චිත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ➢ චිත්‍රයේ මාතෘකාව පසුපිටෙහි දැක්විය යුතුය.

සෑම චිත්‍රයක්ම පිටුපස සිසුදරුවා/දැරිය විසින් එය අඳිනු ලැබූ බවට පන්තිය භාර ගුරුතුමිය සහ විදුහල්පතිතුමා සහතික කළ යුතුය. එසේ නොවන චිත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සමඟ අමුණා එවා ඇති පත්‍රිකාව පුරවා සෑම චිත්‍රයකම පිටුපස නොගැලවෙන සේ අලවා එවිය යුතු අතර, <u>අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ උපදෙස් අනුව දරුවා මෙම තරඟයට සහභාගි වීම සම්බන්ධව මව/පියා හෝ භාරකරුගේ ලිඛිත අවසරය අත්‍යවශ්‍ය වන බවද කාරුණිකව දන්වමි.</u>

සිසු දරුවන් විසින් අඳිනු ලබන චිත්‍ර 2024.09.15 වන දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත සඳහන් කාර්යාලය වෙත ගෙනවිත් බාරදිය හැකිය.

අධ්‍යක්ෂ,(තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා)
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
අංක: 241, උද්‍යාන පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

- දුරකථන අංක 0112500995
- 0112590201
- 0112587373

මෙයට - විශ්වාසි,

අධ්‍යක්ෂ, (තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා)
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

බස්නාහිර පළාත
மாகாண கல்வித் திணைக்களம்
மேல் மாகாணம்
Department of Education
Western Province

ඇමුණුම 02

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / மாகாண கல்விப் பணிப்பாளர் / Provincial Director of Education - 011 2868606

දුරකථන පොදු / பொது தொலைபேசி / General Telephone - 011 2875893/95

ෆැක්ස් / தொலைநகல் / Fax - 011 2868606 (P.D E)

ඊ-මේල් / மி -அஞ்சல் / E-mail - pde@edudept.wp.gov.lk

89, ''රන්මගපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. - WP/ED/EAD/05/ විවිධ | ඔබේ අංකය / உமது இல / Your No. - | දිනය / திகதி / Date - 2024.07 |

බස්නාහිර පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

<u>මාර්ග ආරක්ෂාව තේමාව යටතේ වූ චිත්‍ර තරඟය</u>

උක්ත කරුණට අදාළව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති ශෂි වෙල්ගම මහතා විසින් එවන ලද ජාගකොස/තඅ/2024/142-1 හා 2024.06.24 දිනැති ලිපිය හා බැඳේ.

2. එම ආයතනය මගින් "රිය අනතුරු නොමැති හෙටක් උදෙසා පාසලින් පෙළගැසෙමු" යන්න තේමා කර ගනිමින් චිත්‍ර තරඟයක් පැවැත්වීම සඳහා බස්නාහිර පළාත් පාසල්වල සිසුන් සම්බන්ධ කර ගැනීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

3. ඒ අනුව ඔබ කලාපයට අයත් පාසල් සිසුන් මෙම තරඟාවලියට සහභාගි කර ගැනිමට අවශ්‍ය අනුමැතිය පහත කොන්දේසි වලට යටත්ව ලබා දෙන අතර අවශ්‍ය උපදෙස් විදුහල්පතිවරුන් වෙත ලබා දීමට තරඟාවලියට අදාළ ලිපි කාරුණිකව ඔබ වෙත ඉදිරිපත් කරමි.

කොන්දේසි

- වැඩසටහන ආරම්භ කිරීමට ප්‍රථම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ණ අවසරය සහ අනුමැතිය ලබා ගත යුතුය.
- සහභාගී කර ගන්නා පාසල්වල විදුහල්පති එකගතාවය ලබා ගත යුතුය.
- ගුරුභවතුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ කැමැත්ත මත, වැඩසටහනට සිසුන් සම්බන්ධ කර ගත යුතුය.
- පාසලේ ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා නොවිය යුතුය.
- වැඩසටහන නොමිලේ පැවැත්විය යුතුය.
- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් පනවා ඇති නීති රීති පිළිපැදිය යුතුය
- මෙම අවසරය බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී අවලංගු කිරීමේ බලය ඇත.

අ/කලේ : එච්.නයනි පෙරේරා
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(අධ්‍යාපන පරිපාලන)

පුෂ්පිකා සී. රාජපක්ෂ
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ II
(අධ්‍යාපන පරිපාලන)
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නියෝජ්‍ය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(අධ්‍යාපන පරිපාලන අංශය )
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පිටපත: 01. ශෂි වෙල්ගම මයා, සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව - - දැ.ගැ.ස හා අ.ක.ස

| ශ්‍රේණිය | මාතෘකා සඳහා ශ්‍රේණි කාණ්ඩය | තරඟය සඳහා නියමිත මාතෘකා |
|---|---|---|
| 1 – 2 | ප්‍රාථමික | • කහ ඉරෙන් පාර පනිමු<br>• පාරේ දකුණු පැත්තෙන් ගමන් කරමු.<br>• ඔබ දකින මාර්ග සලකුණු |
| 3 – 4 - 5 | පශ්චාත් ප්‍රාථමික | • වාහන අනතුරක්<br>• කහ ඉරෙන් පාර පනිමු.<br>• පාරේ දකුණු පැත්තෙන් ගමන් කරමු.<br>• ඔබ දකින මාර්ග සලකුණු.<br>• පාරේ සෙල්ලම් කිරීමෙන් වළකිමු. |
| 6 – 7 - 8 | කණිෂ්ඨ | • මාර්ග සංඥා එළිවලට අවනත වෙමු.<br>• මාර්ග අනතුරු වළකමු<br>• මාර්ගය භාවිතයේදී අන් අයට ගරු කරමු.<br>• මාර්ගයේ සිදුවන හදිසි අනතුරක්<br>• මාර්ග නීතිවලට අවනත වෙමු. |
| 9 – 10 - 11 | ජ්‍යෙෂ්ඨ | • මාර්ග නීතිවලට අවනත වෙමු.<br>• නීතිගරුකව මහාමාර්ගය භාවිත කරමු.<br>• මාර්ග නීති උල්ලංඝනය කිරීමෙන් සිදුවන හානි.<br>• පාපුවරුවේ ගමන් කිරීමෙන් වන අනතුරු<br>• මාර්ගය භාවිතයේදී අන් අයට ගරු කරමු. |
| 12 - 13 | ජ්‍යෙෂ්ඨ ද්විතියික | • මාර්ග නීතිවලට අවනත වෙමු.<br>• නීතිගරුකව මහාමාර්ගය භාවිත කරමු.<br>• මාර්ග නීති උල්ලංඝනය කිරීමෙන් සිදුවන හානි.<br>• පාපුවරුවේ ගමන් කිරීමෙන් වන අනතුරු<br>• මාර්ගය භාවිතයේදී අන් අයට ගරු කරමු |

**මෙම තරඟය බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වෙන බැවින්, චිත්‍රය අප වෙත එවීමේදී පහත උපදෙස් පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.**

දරුවාගේ පාසල අයත් දිස්ත්‍රික්කය

**(මෙය සටහන් කිරීම අනිවාර්ය වේ)**

අධ්‍යක්ෂ,(තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

අංක: 241,

උද්‍යාන පාර, නාරාහේන්පිට,

කොළඹ - 05

පාසලේ ලිපිනය